**දේවල් තියෙන්නේ තමා ළඟ බව කියමින්. අපිට ඇයි කවදාවත් මේ ෆයිල් බලන්න බැරි?**

මම ජනතාවට මේ ෆයිල් ඉදිරිපත් කළාට ඒවා සියල්ලේම තියෙණ අන්තර්ගතය විස්තර කරන්න මට හැකියාවක් නැහැ. මොකද, එහෙම කරන්න නම් දින ගණනාවක් ගතවෙන නිසා. මම කළේ පැමිණ සිටි මාධ්‍යවේදීන් සහ ජනතාවගෙන් සමහරකට එතැන තිබුණු ෆයිල්වලින් කිහිපයක් තෝරගන්නය කියලා ඒ තෝරගත්තු ෆයිල්වල ඇතුලේ තියෙන්නේ මොනවද කියා විස්තර කරපු එක. ඒ හැම ෆයිල් එකකම චෝදනා ඇතුළත් ලියවිල්ලක් තිබුණා. කිසිම හිස් ෆයිල් එකක් තිබුණේ නැහැ. මා ගාව තියෙන්නේ හිස් ෆයිල් නම්, ඇත්ත ෆයිල් තියෙන්නේ රනිල් ගාව නම් මොනවද එයා ඒවා තියාගෙන කරන්නේ? ඔබ ඔහුගෙන් ඒ ගැන ප්‍රශ්න කළ යුතුයි. තුන්වෙනි කාරණය ඇවිල්ලා අපි මොනවද මේ ෆයිල් එක්ක කරන්නේ කියන එක. මේවා සුදු කරපටි හොරකම් කියන එක අප තේරුම්ගත යුතුයි. ඒ නිසාම ඒවා ලියවිලි ඇසුරින් ඔප්පු කරන්නට අවශ්‍යයි. සාමාන්‍ය හොරකමක් නම් ඒක ඔප්පු කරන්න පහසුයි. මට තියෙන්නේ හොරකම ගැන ප්‍රධාන තොරතුරු පමණක් නිසා ඒ ලියවිලි ඔප්පු කරන්න අමාරුයි. උදාහරණයක් ගත්තොත්, එයාර්බස් ගනුදෙනුවෙ දී, කපිල චන්ද්‍රසේන සතු ඕස්ට්‍රේලියා බැංකු ගිණුමකට කොමිස් මුදල් බැර කර තිබෙනවා. එම ගිණුමෙන් තමයි ශ්‍රී ලංකාවේ පුද්ගලයින් හතර දෙනෙකුට මුදල් යවලා තියෙන්නේ. මම ගාව මේ සියලු කාරණා ඇතුළත් ලියවිලි තිබෙනවා. නමුත්, මේ බැංකු ගිණුම් පරීක්ෂා කරන්න මට බලය තියෙනවා ද? මේ දේවල් නීතිපතිවරයා හරහා සිදුවෙන ක්‍රමවත් විමර්ෂණයකට යටත් කළ යුතුයි. ආණ්ඩුවේ මූලිකත්වය මත සිදුවෙන විමර්ෂණයක් මෙතැනට අවශ්‍ය යි.

**ප්‍රශ්නය - ඇයි ඔබට අධිකරණයට යන්න බැරි?**

අපට හැකියාව තියෙන්නේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට පමණයි. ඒකයි අපට අධිකරණයට යන්න බැරි. එවැනි තත්ත්වයක අධිකරණය සළකා බලන්නේ මගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති ද, කියන එක. ඒ හැර එතැන වංචාවක් සිදුවී ඇති ද, කියන එක සළකා බැලෙන්නේ නැහැ. අපරාධ නඩුවක් ලෙස ඉදිරිපත් කරන්න නම් අදාළ විමර්ෂණ ආයතන ඒ සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකරන්නටත්, අධිකරණය ඉදිරියේ අපරාධ නඩුවක් ගොනු කරන්නට නීතිපති දෙපාර්තමේන්තුව කටයුතු කරන්නටත් අවශ්‍ය යි. අපි සීනි වංචාවට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර තිබෙනවා. ඒ කාරණයේ දී, අධිකරණය බලන්නේ මගේ මූලික අයිතිවාසිකම් කඩවී තිබේ ද, යන්න පමණයි. ඒ හැර එතැන වංචාවක් සිදුව ඇති ද, යන්න සොයාගැනීමට විමර්ෂණයක් සිදුවෙන්නේ නැහැ. මගේ මූලික අයිතිවාසිකම් කඩවී නොමැති බවට අධිකරණය තීන්දු කළොත්, ජනතාව අතර අදහසක් ඇතිවෙනවා වංචාවක් සිදුව නොමැති බවට. මේවා අපරාධ. ඒනිසාම මේවා අල්ලස් කොමිසම සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ වැඩිදුර විමර්ෂණය විය යුතුයි. එය සිදුකළ හැක්කේ රාජ්‍ය බලය ඇතිව පමණයි. මා ගාව රනිල් වික්‍රමසිංහගේ ෆයිල් තියෙනවා. කොටින්ම නීතිපතිවරයා ගාවත් තියෙනවා.

**ප්‍රශ්නය - ඔබට ඒ තොරතුරු ප්‍රසිද්ධ කරන්න බැරි ඇයි?**

මම මේ ඇතැම් ෆයිල් වෙබ් අඩවියකට එකතු කර තිබෙනවා. මහබැංකු වංචාව ගැන තොරතුරු ඒ අතරින් ප්‍රධානයි. ඔබගේ පුවත්පත පවා ඒ ගැන වාර්තා කළා. ඒ වගේම තමයි මෑතක දී, සිදුවුණු VFS ගනුදෙනුව. ඒක සිදුවුණේ රනිල් වික්‍රමසිංහ නායකත්වය දෙන කැබිනට් එකක. ඔහුට එයින් පළායන්නට බැහැ. ඒක දැනටමත් ප්‍රසිද්ධ වෙලා තියෙන නිසා මට අමුතුවෙන් ප්‍රසිද්ධ කරන්න දෙයක් නැහැ.

**ප්‍රශ්නය - ඔබ ජනාධිපතිවරණය ජයග්‍රහණය කළොත් ඔබ ගාව තියෙන මේ සියලුම ෆයිල් සම්බන්ධයෙන් පියවර ගන්න කටයුතු කරනවා ද?**

අපි බලයට එන්නේ කාගෙන්වත් පළිගන්න නෙවෙයි. අපට කා එක්කවත් පෞද්ගලික ආරෝවක් නැහැ. නමුත්, අපට වගකීමක් තිබෙනවා යුක්තිය පසදන්නට. අපනයන ආදායම අතින් දකුණු කොරියාව, වියට්නාමය වගේ රටවල් බොහෝමයක් අපිව පහුකරගෙන ගිහින්. අපිට මෙහෙම ඉන්න වෙලා තියෙන්නේ දූෂණය නිසා. මේ දූෂණය නිසා ආයෝජකයින් අපේ රටට ආකර්ෂණය වෙන්නේ නැහැ. ඒ වගේම තමයි මේ දූෂණ නිසා ප්‍රමුඛත්වය ලැබිලා තියෙන්නේ අත්‍යාවශ්‍ය ව්‍යාපෘතිවලට නෙවෙයි අත්‍යාවශ්‍ය නොවන ව්‍යාපෘතිවලට. ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 1.1. වැය කරලා හම්බන්තොට වරාය හැදුවා. නමුත්, අපට තිබුණා ඒ මුදල පිරිපහදුවක් වෙනුවෙන් ආයෝජනය කරන්න. ඒ හරහා අපට පුළුවන්කම තිබුණා සැළකිය යුතු ඩොලර් ප්‍රමාණයක් ඉතිරි කරගන්නට. අපේ රටේ දූෂිතයින්ට විරුද්ධව පියවර ගන්න හැකියාව තියෙන්නේ දූෂිතයන් නොවන බලවේගයකට පමණයි. දූෂිතයින්ට දඩුවම් කරනවාය කියන එක 1994 වසරේ ඉදන් චන්ද්‍රිකාගේ, මහින්දගේ, මෛත්‍රීපාලගේ සහ ගෝඨාභයගේ වේදිකාවලින් ඇහුණු දෙයක්. දූෂිතයින් කවදාවත් දූෂිතයින්ට දඩුවම් කරන්නේ නැහැ. දූෂිතයින් හැමදාම කරන්නේ දූෂිතයින්ව ආරක්ෂා කරන එක. ජාතික ජනබලවේගය ප්‍රමුඛත්වය දෙන්නේ දූෂණය අවසන් කිරීමට.

**ප්‍රශ්නය - ආර්ථිකය ගැන කතාකරනකොට, ජාතික ජනබලවේගයේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද කියන එක ගැන ජනතාවට තවමත් පැහැදිලි නොමැති බවක් පෙනෙනවා. ඔබ ජයග්‍රහණය කළොත් IMF ගිවිසුම අහෝසි කරනවා ද? ඔබ ඉදිරියට අරගෙන යන ආර්ථික ප්‍රතිපත්ති මොනවා ද?**

විවිධ අවස්ථාවල අපි අපේ ආර්ථික ප්‍රතිපත්ති ගැන පැහැදිලි කිරීම් සිදුකර තිබෙනවා. නමුත් අපේ හඬ බහුතරයක් ජනතාව වෙත ගොස් නැහැ. ඒක ඒ අයගේ වරදක් නොවෙයි. ඔවුන්ට පණිවිඩය නොලැබෙන තැන්වල සිටයි අපි අපේ අදහස් දක්වා තිබෙන්නේ. වත්මන් ආණ්ඩුව අන්තර්ජාතික මූල්‍ය අරමුදල සමග සිව් වසරක ගිවිසුමක් ඇතිකරගෙන තිබෙනවා. ද්වි-පාර්ශවික ලෙස, බහු පාර්ශවික ලෙස සහ පෞද්ගලික ලෙස ණය දෙන පාර්ශවයන් වෙන වෙනම අපට සිටියා. දැන් මේ සියල්ල තියෙන්නේ IMF එක යටතේ. ණය ප්‍රතිව්‍යුහගතකරණයත් එහෙමයි. ඒ නිසා එයින් එළියට එන්න හැකියාවක් තියෙනවාය කියා අප සිතන්නේ නැහැ. අපි අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ගිවිසුම සමග ඉදිරියට යනවා. හැබැයි, වෘත්තිකයන් මත පනවා තිබෙණ බදු ගැන අපි නැවත සිතා බැලිය යුතුයි. දෙවනුව, දිළිඳු ජනතාවට ආහාර, ඖෂධ සහ අධ්‍යාපනය ලැබෙණ බව අපි තහවුරු කළ යුතුයි. IMF එක අපත් සමග ගිවිසුම්ගත වෙලා ඉන්නේ රට වර්තමාන ආර්ථික අර්බුදයෙන් ගොඩට ගෙන ඒමට උදව්වක් හැටියට. මූල්‍ය ප්‍රතිපත්තිය සමගත් අපට ගැටලු තිබෙනවා. පළාත් මට්ටමින් පවතින ඛනිජ සම්පත් සහ ස්වාභාවික සම්පත් පදනමේ සිට භාණ්ඩ හා සේවා අංශවල සීඝ්‍ර වර්ධනයක් අපි අත්පත් කරගත යුතුව තිබෙනවා. සංචාරක සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවලටත් මෙය අදාළ යි. අලුත් තාක්ෂණය අපට අවශ්‍යයි. බලශක්ති පිරිවැය පහත දමන්නට අපට අවශ්‍යයි. ඉදිරි වසර කිහිපය ඇතුළත විදුලි ගාස්තු සියයට 30-35 අතර ප්‍රමාණයකින් පහත දමන්නට අපි කටයුතු කරනවා. ආයෝජකයින්ට හිතකර පරිසරයක් අපි නිර්මාණය කරනවා. කාර්යක්ෂම රාජ්‍ය ආයතන අපි නිර්මාණය කරනවා. ව්‍යවසායකයින්ට අවැසිව තිබෙණ නීතිමය රැකවරණය අපි ලබාදෙනවා. ස්ථාවර බදු ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට අපි පියවර ගන්නවා. අපේ රටේ දැන් තියෙණ තත්ත්වය යටතේ ව්‍යාපාරයකට පිවිසෙන්න නම් දේශපාලන සම්බන්ධතාවයක් වුවමනාමයි. එහෙම වෙන්න බැහැ. ආර්ථිකයේ ප්‍රජාතන්ත්‍රවාදයක් අපි සහතික කළ යුතුයි.

**ප්‍රශ්නය - ඉදිරිය සැළකීමේ දී, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන ඔබේ ප්‍රතිපත්තිය කුමක් ද? ඔබ එයට එකඟ වනවා ද?**

උතුරේ ප්‍රශ්නය විසඳීමට ව්‍යවස්ථාමය විසඳුමක් පමණක් ප්‍රමාණවත් නොවන බවයි අපේ සිතීම. නමුත්, ව්‍යවස්ථාමය විසඳුමක් ඔවුන්ට අවශ්‍යයි. පොලිස් බලතල ගැන අප නැවත සිතා බැලිය යුතුයි. ඉඩම් බලතල ගත්තොත් අපි මුලින්ම ජාතික ඉඩම් භාවිතා ප්‍රතිපත්තියක් සකස් කරගත යුතුයි. ඒ වගේම, ජාතික ඉඩම් භාවිතා ප්‍රතිපත්තිය බලාත්මක කිරීමට ඉඩම් කොමිසමක් ස්ථාපිත කිරීමටත් අපි එකඟයි.

**ප්‍රශ්නය - ඔබ ලොව පුරා යමින් ශ්‍රී ලංකා පුරවැසියන් මුණ ගැසෙනවා. ඔවුන් ඔබේ දේශන අසන්නට එන්නෙත් විශාල කණ්ඩායම් ලෙස. කවුද මේ සංචාරවලට අරමුදල් දෙන්නේ? මේ දේවල් ගැන විනිවිදභාවයක් තිබිය යුතුයි නේද?**

ඇත්තටම කවුදෝ කියා තිබෙනවා මම රුපියල් ලක්ෂ 700ක් පමණ විදෙස් සංචාරවලට වියදම් කර තිබෙණ බවක්. මම ඉන්දියාවේ සහ චීනයේ සංචාර කළේ එම රටවල රජයන්ගෙන් ලැබුණු ආරාධනාවලට අනුව. සියලු වියදම් දැරුවේ ඉන්දියාවේ සහ චීනයේ ආණ්ඩු.

**ප්‍රශ්නය - ඒ කියන්නේ මේ විදේශ රටවල ආණ්ඩු ඔබට අනුග්‍රහය දැක්වූවා?**

ඔව්. ඔවුන් මට අනුග්‍රහය දැක්වූවා. මම සංචාරය කරන සෑම අවස්ථාවකම යන්නේ සාමාන්‍ය පන්තියේ. ව්‍යාපාර පන්තිය පාවිච්චි කරන කිසිම කෙනෙක් ගැන මට විරෝධයක් නැහැ. කෙනෙක්ට ඒ පිරිවැය දරන්න පුළුවන් නම්, කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මම යන්නේ ලංකාවේ සංක්‍රමණික සේවකයින් අපට ලබාදුන්නු අරමුදල්වල පිහිටෙන්. ඒ නිසා මම නම් කිසිම අවස්ථාවක ව්‍යාපාරික පන්තිය පාවිච්චි කරන්නේ නැහැ. දකුණු කොරියාවට, ඕස්ට්‍රේලියාවට, එක්සත් ජනපදයට, කැනඩාවට, ස්වීඩනයට, එක්සත් රාජධානියට සහ ජපානයට කළ සංචාරවලට මම වියදම් කර ඇත්තේ රුපියල් ලක්ෂ 33.7ක් පමණයි.

**ප්‍රශ්නය - ඔබ විනිවිදභාවය ගැන ගොඩක් කතා කළා. නමුත් ජාතික ජනබලවේගය/ජනතා විමුක්ති පෙරමුණ කිසිම අවස්ථාවක ඔවුන්ගේ වත්කම් හෙළි කර තිබෙනවා ද? ඒ වගේම, ඔබේ පක්ෂයට අරමුදල් ලබාදෙන අය කවුරුන්ද යන්න ගැනත් විනිවිදභාවයක් තිබෙනවා ද?**

පක්ෂයේ අරමුදල් ගැන වරලත් ගණකාධිවරයෙක්ගේ සහතික කිරීමක් සහිත වාර්තාවක් සෑම වසරකම මාර්තු මාසයේ අපි මැතිවරණ කොමිසමට යොමු කරනවා. තොරතුරු දැනගැනීමේ පනත හරහා ඔබට එම වාර්තා මැතිවරණ කොමිසමෙන් ලබාගත හැකියි. මම ඔබට එක දෙයක් කියන්නම්. ගොඩක් අය කියනවා අපිට තමයි දේශපාලන පක්ෂ අතරින් ලොකුම අරමුදල තියෙන්නේ කියා. මැතිවරණ කොමිසමට යොමුකළ වාර්තාවලට අනුව අපිට තිබුණේ රුපියල් ලක්ෂ 830ක අරමුදලක්. මගේ මතකය නිවැරදි නම් එක්සත් ජාතික පක්ෂයට සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට තිබුණේ පිළිවෙලින් රුපියල් ලක්ෂ 350 සහ රුපියල් ලක්ෂ 170 බැගින් වූ අරමුදල්. ඔබට එය විශ්වාස කරන්න පුළුවන් ද? ඔවුන් පාවිච්චි කරන්නේ කලු සල්ලි. ඒක තමයි හේතුව.

ඔවුන්ගේ ගිණුම්වල මුදල් නැහැ. නමුත් තමන්ගේ මැතිවරණ ව්‍යාපාරවලට ඔවුන් විශාල ගණන්වලින් මුදල් පොම්ප කරනවා. ඒ ප්‍රමාණයන් අපිත් එක්ක ගත්තහම සිය ගුණයකටත් වඩා වැඩියි. නමුත් ඔවුන් මැතිවරණ කොමිසමට වාර්තා කරන්නේ ඔවුන්ගේ අරමුදල්වල සත්‍ය වටිනාකමින් හතරෙන් එකක තරමේ ප්‍රමාණයක් පමණයි. අපි හැම සතයක්ම වියදම් කරන්නේ බැංකු හරහා. මම මගේ වත්කම් ප්‍රකාශය කතානායකවරයාට යොමු කර තිබෙනවා.

**ප්‍රශ්නය - සමහර රටවල්වලට ලංකාවේ ඊළඟ ජනපතිවරයා ජනතා විමුක්ති පෙරමුණෙන් පත්වෙනවා දකින්නට වුවමනා නිසාත්, ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් දකින්නට වුවමනා නිසාත්, ඔවුන් ඔබේ පක්ෂයට අරමුදල් සපයනට බවට චෝදනා තිබෙනවා. මේ ගැන ඔබට කියන්නට ඇත්තේ මොනවා ද?**

අපිට කිසිම රටකින් අරමුදල් ලැබී නැහැ. මම ඉස්සෙල්ලා කිව්වේ. මගේ ගුවන් ටිකට්පත්වල පිරිවැය දැරුවේ ඉන්දියාවේ සහ චීනයේ ආණ්ඩු. ඒ හැරෙන්නට අපිට කිසිම මුදලක් ලැබී නැහැ. අපි කුඩා බලවේගයක්. හැබැයි කිසිම රටකට හෝ සංවිධානයකට අපිව මුදලට මිලදී ගන්න නම් බැහැ. ඔය චෝදනා කරන්නේ මුදලට යටවුණු නායකයින්.